**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - 2013**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2013 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට වත්කමක ක්ෂය කිරීම ආරම්භකළ යුතු වුවත් එයට පටහැනිව වත්කම් මිළදීගත් වර්ෂයේ ක්ෂයවීම් නොසලකා හැර තිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01**

මධ්‍යස්ථානය වෙත ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු මෝටර් වාහන සම්බන්ධ ක්ෂය වටිනාකම රු.3,161,423 ක් අඩුවෙන් සහ පරිගණක උපාංගවල ක්ෂය වටිනාකම රු.19,256 ක් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවන ලද දායකය පිළිවෙලින් රු.161,668 ක් සහ රු.1,077,789 ක් එම ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණු අතර වැටුප් හා වේතන ගිණුමේද එම ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කිරම ඔය ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආපදා වැලැක්වීම සඳහා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ගෙවා තිබුණු රු.500,000 ක මුදලක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වනවා වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන යටතේ දක්වා තිබුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ආපදා කළමනාකරණ ජාතික සභාවේ කටයුතු වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් වැය කර තිබුණු එකතු වටිනාකම රු.6,468,909 ක් වූ වියදම් සම්බන්ධ වවුචර්පත් 05 කට අදාල බිල්පත්‍ර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නොපියවූ අත්තිකාරම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් වෙත ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා වර්ෂය තුළදී ලබා දුන් රු.7,245,882 ක ප්‍රතිපාදන අතුරින් රු.1,446,945 ක ප්‍රතිපාදන, 2013 දෙසැම්බර් 31 දිනවන තෙක් පියවා නොතිබුණි. තවද, එකතුව රු.1,217,215 ක්වූ අත්තිකාරම් පියවා තිබුණේ මාස 06 ක ප්‍රමාදයකින් පසුවය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවලින් රු.9,860,861 ක ඌනතාවයක් නිරූපණය වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,142,118 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.1,718,743 කින් වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේදී පිරියත, යන්ත්‍රෝපකරණ හා අනෙකුත් ආපදා කළමනාකරන උපකරණ නඩත්තුකිරීමේ වියදම් ඉහළයාම ඌණතාවයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති**

දිවයිනේ විවිධ ප්‍රදේශවල ජීවත්වන ජනතාවට මුහුණදීමට සිදුවන ගංවතුර, නායයෑම්, නියං, සුළිසුළං, වෙරළ උවදුරු සහ සත්ත්ව ප්‍රහාරය වැනි ව්‍යසන පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හඳුනාගෙන ඒවා අවම කිරීමට කටයුතු කිරීම

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. ඒ අනුව සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ වශයෙන් ව්‍යාපෘති 84 ක් ක්‍රියාත්මක කිරීමට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු.398,962,375 ක් විය. මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අරමුදල් ලබාදීම සිදුකරන අතර, එම ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමෙන් පසුව අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ පසු පරීක්ෂාවන් කාලීනව සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.25,655,358 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැය මත හම්බන්තොට, කළුතර සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් රු.16,472,362 ක මුදලක් වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ඉතිරිව තිබුණු නමුත් එම මුදල් වර්ෂය අවසන්වූ වහාම මධ්‍යස්ථානය වෙත ප්‍රේෂණය කරගත් බව හෝ විධිමත් පරිදි වෙනත් ව්‍යාපෘතිවලට මාරුකළ බැව් නිරීක්ෂණය නොවීය.

(ii) සෑම ව්‍යාපෘතියක්ම අවසන් වීමෙන් පසුව එයට අදාල බිල්පත්, අධියාචනා පත්‍ර සහ වැඩ අවසන් කළ බවට වාර්තා ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.27,905,890 ක් වැය කර හම්බන්තොට, මාතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 05 ක් සම්බන්ධයෙන් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව වර්ෂය තුළ වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව නිවැරදිව ලබා ගැනීමට නොහැකි විය.

**(ආ) පෙර සූදානම් සැලසුම් සකස් කිරීම පිළිබඳ කටයුතු**

ආපදා අවදානම් අවම කර ගැනීමේ අරමුණින්, සෑම දිස්ත්‍රික්කයම පෙර සූදානම් සැලසුම් කිරීම, මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී පෙර සූදානම් සැලසුම් කිරීම වෙනුවෙන් වැඩසටහන් 295 ක් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.6,972,933 ක මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කර තිබුණි. වැඩසටහන් 295 ක් පැවැත්වීමට කටයුතු කර තිබුණද, එසේ පවත්වන ලද වැඩසටහන් සම්බන්ධයෙන් ආරම්භක අවස්ථාවේදී ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමත්, වැඩසටහන අවසානයේදී කළවැඩ වාර්තාවක් සකස්කර ඉදිරිපත් කිරීමත් සිදුකර නොතිබීම හේතුවෙන් එම වැඩසටහන් පැවැත්වූ කාලය, සහභාගිවූවන්ගේ ප්‍රතිචාර හා ගැටළු අවම කර ගැනීමට ඉදිරිපත් කරන ලද නිර්දේශයන් යනාදිය සනාථ කර ගැනීමට සාක්ෂි ලබාගැනීමට විගණනයේදී නොහැකි විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2008 වර්ෂයේදී ස්ථානගත කර තිබුණු තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානය (SLT Hub) 2011 වර්ෂයේ සිට 2014 ජූලි 31 දින තෙක් ක්‍රියාත්මක තත්ත්වයක නොපැවතුණි.

(ආ) ලබාගැනීමට අපේක්ෂිත සැපයුම හෝ සේවාව සඳහා ඍජුවම ගෙවීම් කළහැකිව තිබියදී දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණු වාහන අළුත්වැඩියා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. එසේ ලබාදුන් මුදලින් රු.402,987ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ නගර සම්බන්ධයෙන් ආපදා ප්‍රත්‍යස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ගික පෙර දැනුම්දීමේ ධාරිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපකරණ මිළදී ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් රු.12,484,343 ක් මධ්‍යස්ථානය වෙත සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබුණි. එම වටිනාකමින් රු.4,369,506 ක් අදාල භාණ්ඩ මිළදී ගැනීම සඳහා යොදවා නොගෙන මහා භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

(ඈ) මධ්‍යස්ථානය විසින් හදිසි ප්‍රතිචාර සඳහා මිළදීගත් උපකරණ වලින් රු.15,510,050 ක් වටිනා උපකරණ වර්ග 08 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් බෙදා නොහැර මධ්‍යස්ථාන ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂය තුළදී එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින්, ආපදාවන් පිළිබඳව පාසැල් දරුවන් දැනුවත් කිරීම සඳහා පාසැල් වෙත බෙදාහැරීමට සකස් කර මුද්‍රණය කරන ලද රු.1,454,035 ක් වටිනා පොත් කට්ටල 1,960 ක් බෙදා නොහැර සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වර්ෂ දෙකකට අධික කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

**4.3 බාහිර පාර්ශවයන් වෙත ලබා දුන් මධ්‍යස්ථානයේ සම්පත්**

ආපදා කළමනාකරණ සන්නිවේදන හා ප්‍රතිචාර ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 2010 වර්ෂය තුළදී ණය ආධාර මත මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු රුපියල් 19,500,000 ක් වටිනා ජීප් රථය, 2010 නොවැම්බර් මාසයේ සිට බාහිර පාර්ශවයක පරිහරණය සඳහා ලබාදී තිබුණි.

**4.4 කාර්ය මණ්ඩලය පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2011 අප්‍රේල් 11 දින අනුමත කරවා ගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට තනතුරු 31 ක් පුරප්පාඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. එම තනතුරු අතරින් අධ්‍යක්ෂකවරුන් 01 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 07 ක් සහ සන්නිවේදන තාක්ෂණික ශිල්පීන් 03 ක් සම්බන්ධයෙන් වර්ෂ 02 කට පෙර සිට පැවති පුරප්පාඩු පිරවීමට 2014 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ ආපදා වැළැක්වීම සහ අවම කිරීම සඳහා වූ අංශය, අධ්‍යක්ෂ (මෙහෙයුම්) සහ සහකාර කළමනාකරණ නිලධාරීන් 03 දෙනෙකු ගෙන් සමන්විත වුවද, ව්‍යාපෘතිවල පසුවිපරම් කටයුතු පරීක්ෂාව සඳහා තාක්ෂණික නිලධාරීන් පත්කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පනත ස්ථාපිත කිරීම**

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මකව තිබුණි. මෙම පනත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංශෝධනය කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2014 ජූනි 16 දින ඉදිරිපත් කර තිබුණි. 2014 සැප්තැම්බර් 30 දින වනතෙක් එම කෙටුම්පත් පනත සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

**5.2 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම**

ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ ඇති ප්‍රතිචාර දැක්වීමේ කටයුතු එකට එක් කරමින් සියළු ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් 2010 වර්ෂයේදී සකස් කිරීමට ආරම්භ කරන ලදි. කෙසේවුවද, මෙම සැලැස්ම 2014 සැප්තැම්බර් 15 දින තෙක්ම කෙටුම්පත් තත්ත්වයේ පැවතිණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා විගණන නිලධාරීන් 02 ක් පමණක් අනුයුක්ත කර තිබුණු බැවින් මධ්‍යස්ථානයේ කටයුතු ප්‍රමාණවත් පරිදි ආවරණය වන පුළුල් විගණනයක් සිදුකළ නොහැකිවී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම් කටයුතු
(ආ) අත්තිකාරම් පියවීම
(ඇ) ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති මෙහෙයවීම
(ඈ) ගබඩා පාලනය
(ඉ) රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රදාන